# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2273/05 - 2022 මාර්තු මස 28 වැනි සඳුදා - 2022.03.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ**

**අම්බලන්ගොඩ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම.**

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන් විසින් සභික ධුරයෙන් පහ කිරීම හේතුකොට ගෙන අම්බලන්ගොඩ නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ අම්බලන්ගොඩ නගර සභාවේ අංක 06 කරිත්තකන්ද කොට්ඨාසයට තේරී පත් වූ ගංගේ සරත් ශ්‍රීලාල් ද සිල්වා අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සකු වී නොමැති අපේක්ෂකයකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නා වූ ද එම අම්බලන්ගොඩ නගර සභාවේ අංක 06 කරිත්තකන්ද කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා කස්තුරි ආරච්චි පින්නවලගේ ජීවන් සුපවිත්‍ර නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

අම්බලන්ගොඩ නගර සභාවේ තේරීම්භාර නිලධාරී වේවැල්වල හේවගේ රවීන්ද්‍ර විජය කුමාර වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් කස්තුරි ආරච්චි පින්නවලගේ ජීවන් සුපවිත්‍ර, අම්බලන්ගොඩ නගර සභාවේ අංක 06 කරිත්තකන්ද කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරාපත් කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. එච්. ආර්. විජය කුමාර,
තේරීම්භාර නිලධාරී,
අම්බලන්ගොඩ නගර සභාව.

2022 මාර්තු මස 28 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගාල්ල.

EOG 03-1014

1A - G 36471 — 20 (2022/03)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*